සැමට මානව අයිතිවාසිකම් සාම ක්‍රියාවලියෙහි දී
සුළුතර කොටස් සහ අයිතිවාසිකම් ව්‍යාපෘතිය

# ආගමික සුළුතර කොටස්


## යුරේෂා ප්‍රනාන්දු



ශ්‍රී ලංකා
මානව හිමිකම් කොමිසම

අනුග්‍රහය : යුරෝපා සංගමය

Acc. 337

Human Rights Commission of Sri Lanka
No. 36, ... Road,
Colombo 08.

# ආගමික සුළුතර කොටස්

## 1. ආගමික අයිතිවාසිකම් පරිරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික පාලන ක්‍රමය

මහා ව්‍යසනයේ අළු මතින් නව ලෝක රටාවක් මතුවිය. එය වූ කලී අන් සියල්ලටම වඩා මානව පුද්ගලයාගේ වටිනාකම පිළිගත් රටාවකි, යුද කෝලාහලවලට හේතුකාරක වූ වාර්ගික, ආගමික හා සංස්කෘතික විෂමතා අභිබවා ගිය ලෝකයකි. අනාදිමත් කාලයක සිට ක්‍රිස්තියානුවන් සහ යුදෙව්වන් අතර පැවති නොඉවසීම සහ ආක්‍රමණය මිනිස් ඉතිහාසයේ ඉතා බිහිසුණු මිනිස් ඝාතනවලින් එකක් ලෙසින් උච්චස්ථානගත විය. ජනවර්ග ශුද්ධ කිරීමේ ක්‍රියාවක් වශයෙන් ජර්මානු යුදෙව්වන් කෲර ලෙස ඝාතනයෙන් ඇරඹි බිහිසුණු යුගය ඇත්ත වශයෙන්ම ආගමික මතවාදවල ඇති මූලික වෙනස්කම් විද්‍යමාන වීමකි. මේ අවස්ථාවේ දී ආගම සහ විශ්වාසය අතර වෙනසක් දැක්වීම වැදගත්වෙයි. සාමාන්‍ය විශ්වාසයක හා පොදු දෙවිවරයෙකුගේ අනුගාමිකයන් වුව ද මතුපිටින් දැක්වෙන මතවාදී වෙනස්කම්, නොඉවසීම හා මෙබඳු වූ ඉමහත් හා කෲර වර්ග නැසීමක් කරා යැම ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි.

ඉතිහාසයේ සිදු වී ඇති බිහිසුණු යුද කෝලාහලවලින් ඇතැම් විටෙක හේතු සාධක මතවාදී වෙනස්කම් දක්වා දිවයන බව නොයාගත හැකි අතර, ඒවා ආගමික ශක්තිය විසින් අරඹා තිබේ. ආගමික ශක්ති උන්මාදය උත්පාදනය කරන්නේ මූලිනුපුටා දමන ලෙස එම ආගමික නිර්මාතෘන් විසින් තම අනුගාමිකයන්ට දේශනා කළා වූ එකී පාප කර්මයන්ම වේ1.

කුරුස යුද්ධවල සිට යුදෙව් ආගමික විශ්වාස දැරූ අයට කෲර පන්දමින් වධ හිංසා පැමිණවීම දක්වා වූ සිද්ධි මෙම කාරණය තියුණු ලෙස සිහිගන්වන ඒවාය. එපරිදිම, මානව අයිතිවාසිකම් සඳහා වූ බලවත් ඓතිහාසික පරිශ්‍රම හා ඉන් පසු පැවති උද්ඝෝෂණ වරින් වර දියත් කර ඇත්තේ ආගම් සම්බන්ධ එකී අයිතිවාසිකම් පරිරක්ෂණය කිරීම සඳහාය.

එබැවින්, වර්ගය, ආගම හා ජන වාර්ගික භාවයේ නාමයෙන් ඉතිහාසය පුරාම සිදුකර ඇති මහ පරිමාණයේ වධ හිංසා හේතුවෙන් හා මානව අයිතිවාසිකම් ස්ථාපිත කරන ලෙස නැගුණු විශ්ව හඬට ප්‍රතිචාරයක් වශයෙන් ද මෙම මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ පරිරක්ෂණය කිරීම සඳහා කැප වූ

අන්තර්ජාතික පාලන ක්‍රමයක් 20 වන ශතවර්ෂයේ පසු භාගයේ දී මතුවිය. කෙසේ වෙතත්, වර්ධනය වී ඇති මෙම තත්ත්වය තිබියදීත් ලෝකයේ බොහෝ ප්‍රදේශවල ආගමික සමානත්වය සඳහා වූ පරිශ්‍රම අද දක්වා පවතී.

එම කාලවකවානුව තුළම ජාතික රාජ්‍යයන් සහ බහු-ජනවාර්ගික සමාජ බිහිවීමත් සමගම, නූතන තත්ත්වය යටතේ වන ආගමික සමානත්වය පිළිබඳ පරිශ්‍රම ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර ඒවා බවට පත්වී තිබේ. ආගමික සුළුතර කොටස් පිළිබඳ කාරණය ද්විමාන එකකි. එය වූ කලී, එක් ප්‍රධාන මතවාදයක් උදෙසා ගතානුගතික ආගම් ඉවත දැමීමට බැඳී සිටින රාජ්‍යවලට සීමාවී නැති අතර, නීති මගින් සහ රාජ්‍ය ප්‍රතිපත්ති මගින් යම් ආගමකට ලැදියාවක් පෙන්වන රාජ්‍යයවල ද ඒ හා සමගම එය දක්නට ලැබේ. ඉරානය එවැනි නිදසුන්වලින් එකකි2.

ව්‍යවස්ථානුකූල වශයෙන් ද "රාජ්‍යයෙන්" "දේවස්ථානය" වෙන්කරන්නා වූ ගිහි රාජ්‍ය පාලනය පිණිස සැප වූ "නූතන ජාතික රාජ්‍යයට " ප්‍රතිපත්ති මට්ටමේ දී විවිධ ආගම් ගැන සලකුණු කිරීමේ දී වෙනස්කම් සිදු කිරීමට නොහැකි සේ බැලූ බැල්මට පෙනී යා හැක. කෙසේ වෙතත් එක්සත් ජාතීන්ගේ විශේෂ සම්බන්ධීකාරක ක්‍රිෂ්ණස්වාමි විසින් කලින් ඉදිරිපත් කළ උප කොමිසමේ වාර්තාවක සඳහන් කළේ "වෙන් කිරීමේ මූල ධර්මය තුළ.. ඇතැම් අවස්ථාවල කිසියම් ආගමක් ක්‍රියාත්මක වශයෙන් අතිශය උසස් ස්ථානයක් ගන්නා අතර රටේ නීතිය-සැම කෙනෙකු කෙරෙහිම සමාන ලෙස ක්‍රියාත්මක විය යුතු නමුදු-ඇතැම් වැදගත් කරුණු සම්බන්ධයෙන් ප්‍රධානතම කණ්ඩායමේ සංකල්ප පිළිබිඹු කරයි"3 යනුවෙනි. "වර්ගය" වුව ද බොහෝදුරට ප්‍රධානතම ආගම අනුව අර්ථකථනය කර ඇති තත්ත්වයක් තුළ-ශ්‍රී ලංකාවේ "සිංහල බෞද්ධයා" මීට හොඳම නිදසුනකි.- ආගමික සුළුතර කොටස්වලට සම්බන්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට විශේෂයෙන් සැප වූ අන්තර්ජාතික පාලන ක්‍රමයක අවශ්‍යතාව තවදුරටත් අමතක කළ නොහැක.

ආගමික හා ඇදහිලි පිළිබඳ නිදහස සහ, විශේෂයෙන්ම, ආගමික සුළුතර කොටස්වල අනන්‍යතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමිති ඇතිකළ බොහෝ ප්‍රකාශන හා ගිවිසුම්වලට මුල්වූයේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි. ආගමික ගැටුම් පාලනය කිරීම සඳහා ද බහු-ආගමික සමාජවල ප්‍රජාතාන්ත්‍රික ආයතන පිහිටුවීම සඳහා ද යොමුගත තත්වානුකූල ප්‍රතිපත්තිමය විකල්ප සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිමාන රාමුවක් එමගින් ලබාදෙයි4. අන්තර්ජාතික

මානව අයිතිවාසිකම් නීති ගණය යටතේ ඇතුළත්කර තිබෙන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුම් වූකලී ප්‍රමුඛ ගණයේ නීත්‍යානුකූල ලේඛනයකි. විශේෂයෙන්ම ජනවාර්ගික, ආගමික හා භාෂාමය සුළුතර කොටස් ආරක්ෂා කිරීම පරිරක්ෂණයට කැපවූ 27 වන ව්‍යවස්ථාව සහ චින්තනය, හෘදය සාක්ෂිය සහ ආගම පිළිබඳ නිදහස පරිරක්ෂණය කරන 18 වන ව්‍යවස්ථාව, සිය පුරවැසියන්ට මෙකී අයිතිවාසිකම් සහතික කිරීම සඳහා, පාර්ශවකාර රාජ්‍යයන් වෙත වගකීමක් පවරයි. සියලු ආගම්වල හෝ ඇදහිලිවල හෝ භාවිත උල්ලංඝනය කිරීමෙන් ආරක්ෂා වීමට ද ඒවායේ අනුගාමිකයන් වෙනස්කම්වලට භාජනය කිරීමෙන් ආරක්ෂා කිරීමට ද අදාළ පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සලකා බැලීමට ද කමිටුවට බලය පැවරී තිබේ5.

මේ හැරුණුවිට, චින්තනය, හෘදය සාක්ෂිය, ආගම් හා ඇදහිල්ල සඳහා අයිතිවාසිකම මෙන්ම ආගමික සුළුතර කොටස්වලට අයත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ද පරිරක්ෂණය සඳහා එක්සත් ජාතීන් මෙන්ම කලාපීය හා වෙනත් සංවිධාන යන දෙකොට්ඨාසය විසින්ම විශේෂ නීත්‍යානුකූල ලේඛන වශයෙන් පනවා ඇති අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය විසින් බොහෝ සේ පිළිගෙන තිබේ.

1992 දී මහා සභාව විසින් අනුමත කරන ලද ජාතික හෝ ජනවාර්ගික, ආගමික හා භාෂාමය සුළුතර කොටස්වලට අයත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය එක් නිදසුනකි. එම ප්‍රකාශනය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 27 වන ව්‍යවස්ථාව විසින් ධෛර්යමත් කළ බව ප්‍රකාශනයේ ප්‍රස්ථාවනාව නිශ්චිත ලෙස සඳහන් කරයි.

මෙම අයිතිවාසිකම්වලට සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සියලු ප්‍රකාශන සහ සම්මුති පහත සඳහන් ලැයිස්තුවේ ඇතුළත්වේ.

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1948)

සරණාගතයන්ගේ තත්ත්වයට සම්බන්ධ සම්මුතිය (1951)

අධ්‍යාපනය තුළ වෙනස්කම්වලට භාජනය කිරීමට විරුද්ධ යුනෙස්කෝ සම්මුතිය (1960)
වාර්ගික හේතු මත වෙනස්කම්වලට භාජනය කිරීමේ සියලු විධි ඉවත්

කිරීම පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1965)

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුම (1966)

තමන් පදිංචි රටේ ජාතිකයන් නොවන රටේ මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය (1985)

ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989)

සියලු සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය. (1990)

ජාතික හෝ ජනවාර්ගික, ආගමික සහ භාෂාමය සුළුතර කොටස්වලට අයත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය (1992)

මේවා හැරුණුවිට, යුරෝපා සංගමයේ සහ යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාව පිළිබඳ සම්මේලනයේ සාර්ව රාමු ඇතුළත පවත්නා ආගමික අයිතිවාසිකම් සම්බන්ධ යුරෝපා ප්‍රකාශන සහ සම්මුති ද ආගමික සුළුතර කොටස් සුරැකීම සඳහාවන පාලන ක්‍රමයට ඇතුළත් වේ. බහු පාර්ශ්වීය ගිවිසුම් සහ සම්මුති ගණනාවක් විසින් ආගම් හෝ ඇදහිලි පිළිබඳ නිදහස සහ ආගමික සුළුතර කොටස්වලට අයත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් අමතනු ලැබ තිබේ. වඩාත් ප්‍රකාමින් වැදගත් ඒවා වන්නේ:

මානව අයිතිවාසිකම් පිළිබඳ යුරෝපා සම්මුතිය (1950) සහ අංක 11 මූලපත්‍රය (1954)

යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාව පිළිබඳ සම්මේලනයේ අවසාන පනත (1975)

යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාව පිළිබඳ සම්මේලනයේ මැඩ්‍රිඩ් රැස්වීමේ නිමා කිරීමේ ලියවිල්ල (1983)

යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාව පිළිබඳ

සම්මේලනයේ වියනා රැස්වීමේ නිමාකිරීමේ ලියවිල්ල (1989)

නව යුරෝපයක් සඳහා වූ පැරිස් ප්‍රඥප්තිය (1990)

යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාව පිළිබඳ සම්මේලනයේ කෝපන් හේගන් රැස්වීමේ නිමාකිරීමේ ලියවිල්ල (1990)

යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාව පිළිබඳ සම්මේලනයේ හෙල්සින්කි හි පැවති නායක රැස්වීමේ තීරණ (1992)

මානව අයිතිවාසිකම් පිළිබඳ ලෝක සම්මේලනයේ දී සම්මත කරගත් වියානා ප්‍රකාශනය සහ ක්‍රියාත්මක වැඩසටහන (1993)

ජාතික සුළුතර කොටස් සුරැකීම සඳහා වූ සම්මුති රාමුව 1994)

ආගමික අයිතිවාසිකම්වලට සම්බන්ධ අන්තර් ඇමරිකානු ප්‍රකාශන සහ සම්මුති ඇමරිකානු රාජ්‍ය සංවිධානය විසින් සම්මත කරනු ලැබ සහ පිළිගනු ලැබ තිබේ. නිදසුන් කිහිපයක් පහත දක්වා තිබේ.

මිනිසාගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳ ඇමරිකානු ප්‍රකාශනය (1948)

මානව අයිතිවාසිකම් පිළිබඳ ඇමරිකානු සම්මුතිය (1969)

මානව අයිතිවාසිකම් පිළිබඳ ඇමරිකානු සම්මුතියේ ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ අතිරේක මූල පත්‍රය (1988)

පහත සඳහන් පරිදි ආගමික අයිතිවාසිකම්වලට සම්බන්ධ අප්‍රිකානු ප්‍රකාශන සහ සම්මුති ගණනාවක් තිබේ. :

ෂානව සහ ජනතා අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු ප්‍රඥප්තිය (1981)

ළමයාගේ අයිතිවාසිකම් සහ සුභසාධනය පිළිබඳ අප්‍රිකානු ප්‍රඥප්තිය

වර්ධනය වෙමින් පවතින ආගමික මූලධර්මවාදය සහ ජනවාර්ගික/ආගමික ව්‍යාපාර හමුවේ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පරාසය ඇතුළත ආගමික සුළුතර කොටස් පිළිබඳ කාරණයේ හඬ ගොඩනැගෙමින් තිබේ. ප්‍රාදේශීය, ජාතික හා විශ්වීය මට්ටම්වල පවතින සමාජ ගැටුම්වලට ප්‍රධාන හේතුව ලෙස ආගමික වෙනස්කම් පවතී. එබැවින් විශේෂයෙන් බහු ආගමික සමාජවල ජාතික මට්ටමින "විවිධත්වය තුළ සුහදත්වය" ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවයේ වැදගත්කම විශේෂයෙන් කිවයුතු නැත. සැලකිලිමත් මෙසේ හෙයින් බහුවිධ ආගමිකත්වයන්හි ගතික සැලකිල්ලට ගෙන අන්තර්ජාතික නෛතික ප්‍රතිමාන පදනම්කරගත් ප්‍රතිපත්ති ආදර්ශක සකස් කිරීම සඳහා සංස්කෘතික පාදක ප්‍රවේශයන් අනුගමනය කළයුතුම කාර්යයකි.

## 2. ආගමික අයිතිවාසිකම් සම්බන්ධව ශ්‍රී ලංකාවේ වර්තමාන නෛතික තත්ත්වය.

අභ්‍යන්තරීකරණය වූ ශ්‍රී ලාංකික පර්යාලෝකයක් තුළ ආගමික සුළුතර කොටස් පිළිබඳ කාරණය ඊට සම්බන්ධව දැනට පවතින නෛතික විධිවිධාන සහ අන්තර්ජාතික ප්‍රතිමාණවලට ඒවා අනුකූලවන ප්‍රමාණය අනුසාරයෙන් සලකා බැලිය යුතු වෙයි.

ශ්‍රී ලාංකීය සංදර්භයක් තුළ ආගමික සුළුතර කොටස් පිළිබඳ යාතව්‍යා කිරීම වූ කලී "සිංහල - බෞද්ධයන්" සමඟ සමාන අන්දමට "සුළුතර ආගම්" තුනට තත්ත්වයක් ලබාදී තිබේ ද යන්න පිළිබඳ ප්‍රශ්නයක් වන්නේය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 ව්‍යවස්ථාව "සෑමෙනකුගේ කැමැත්ත අනුව ආගමක් හෝ ඇදහීමක් වැළඳ ගැනීමට හෝ තෝරා ගැනීමට නිදහස

ඇතුළුව චින්තන, හෘදය සාක්ෂිමය හා ආගමික නිදහසට අයිතිවාසිකම" පරිරක්ෂණය කරයි. ශ්‍රී ලංකාව තුළ තිබෙන සියලු ආගම් අදහන්නන් වෙත සමාන අයිතිවාසිකමක් පිරිනමා ඇත. එනම් ප්‍රධාන වශයෙන් බුද්ධාගම, ක්‍රිස්තියානි ආගම (කතෝලික ආගම හා විවිධ නිකායන් ඇතුළුව), ඉස්ලාම් ආගම හා හින්දු ආගම වෙයි. මෙම ව්‍යවස්ථාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුමේ 18 වන ව්‍යවස්ථාවට සමවෙයි.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුමේ 18 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ඇතුළත් කිරීමෙන් ආගමික සුළුතර කොටස්වල අයිතිවාසිකම්වලට සම්බන්ධ අන්තර්ජාතික ප්‍රතිමාන අනුමත කිරීමක් දක්නට ලැබෙන නමුදු, පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් ජනවාර්ගික, ආගමික හා භාෂාමය සුළුතර කොටස්වල අයිතිවාසිකම් සුරැකීම අවශ්‍ය වන්නා වූ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුමේ 27 වන ව්‍යවස්ථාව ශ්‍රී ලාංකික නීති හා ප්‍රතිපත්ති විසින් පිළිපැද ඇද්ද යන ප්‍රශ්නය මතුවෙයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වේ:

"ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය. එහෙයින්.. බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම වියයුත්තේයර."

බැලූ බැල්මට පෙනෙන පරිදි මෙම ව්‍යවස්ථාව සමානත්වය පිළිබඳ මූලධර්මය සහ ලෞකික රාජ්‍ය පාලනය පිළිබඳ සිද්ධාන්තය නිහීන ලෙස උල්ලංඝනය කිරීමකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එවැනි විධිවිධානයක් තිබීම බහුතරවාදී ප්‍රවේශයක් ගැන ප්‍රකාශ කිරීමක් සේ පෙනෙනවා පමණක් නොව ප්‍රතිවිරුද්ධ අන්දමින් එය බුද්ධාගමේම දක්වා ඇති සමානාත්මතාවයේ මූලධර්මයට විරෙහිව යන බවක් ද පෙනෙයි.

පළමුව හා මූලිකව ශ්‍රී ලංකාව වැනි, තම භෞමික අඛණ්ඩතාවය පරිරක්ෂණය කිරීමට කැපවී සිටින බහු ජනවාර්ගික, බහු ආගමික සහ බහු භාෂාමය රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එවැනි විධිවිධානයක් ඇතුළත් කිරීමේදී ඇතිවන පූර්ණ ඝටනය හඳුනාගත යුතුය. ජනවාර්ගික ගැටුම, දෙමළ කොටි ව්‍යාපාරයක් ලෙස උග්‍ර අවස්ථාවට පත්වීම ඇතැම් උගතුන් විසින්

සලකනු ලබන්නේ 1948 පුරවැසි පනත හා 1956 රාජ්‍ය භාෂා පනත වැනි වූ වෙනස්කම්වලට හාජනය කිරීමේ දේශපාලන ක්‍රියාදාමයන් විසින් බිහිකරනු ලැබූ ආතතිය උච්චස්ථානයකට පත්වීම බවයි. “වර්ගය, කුලය හෝ ආගම වෙනුවට මූලධර්ම හා ප්‍රතිපත්ති අනුව ප්‍රමාණවත් අන්දමින් කරුණු සලකා බැලීමට එතකාට කවුරුත් ඉගෙන ගෙන නැත”7 යනුවෙන් 1959 සීමා නිර්ණායක කොමිසම ප්‍රකාශ කළාය. එම නිසා නියැකවම 1978 ව්‍යවස්ථාවේ 9 වැනි ව්‍යවස්ථාව වූ කලී මෙම සංසිද්ධිය පිළිබඳ තවත් විද්‍යමාන විමසීයි.

අනික් අතට, මෙම ව්‍යවස්ථාමය විධිවිධාන මතුපිටින් කියවීම පදනම්කොට ගත් අර්ථකථනයක් අනුගමනය නොකර, එහි ගම්‍යමාන සහ සටන තක්සේරු කිරීම පිණිස එය සංස්කෘතිකමය සංදර්භයකින් සලකා බැලීම වැදගත්වේ. මෙම ව්‍යවස්ථාවෙන් ඇතිකර ගෙන තිබෙන ආගතීන් සමනය කිරීම, ඊට සංශෝධනයක් කිරීමෙන් නියැකවම සිදුවිය හැකි අතර, එය යෙදිය හැකි වන්නා වූ සංදර්භය අනුසාරයෙන් තේරුම් ගැනීම වැදගත්ය.

“10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ 1 වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂාකර දෙන අතර, බුද්ධ ශාසනය සුරක්ෂිතකොට පෝෂණය කිරීම රජයේ වගකීම වියයුත්තේය”8 යනුවෙන් අංක 9 ව්‍යවස්ථාව තවදුරටත් සඳහන් කරන දෙය සටහන් කර ගැනීම වැදගත් වෙයි. තවද පුද්ගලයාට ඔහු කැමති ආගම ඇදහීමට ඇති මූලික අයිතිවාසිකම් -නිදහස 10 වන ව්‍යවස්ථාව හා 14 (1) (ඉ) දරණ ව්‍යවස්ථාව යන දෙකෙහිම ප්‍රකාශිතවම දක්වා තිබේ. එම නිසා බුද්ධාගම පරිරක්ෂණය කිරීමට රජය මත ඒකාන්ත යුතුකමක් පවරා ඇති අතර එම යුතුකම සම්පූර්ණ කිරීමේදී අනෙකුත් ආගම් වෙනස්කම්වලට හාජනය නොකිරීමකට සහතික කිරීමේ සමාන යුතුකමක් ද පවතී. තවද 12 (2) ව්‍යවස්ථාව “කිසිම පුරවැසියෙකු, වර්ගය, ආගම, භාෂාව...” යනාදී වශයෙන් සඳහන් කරයි. එබැවින් “බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන” නමුදු, ඉහත සඳහන් ව්‍යවස්ථාමය විධිවිධාන යටතේ පුද්ගලයාට අයත්වන ආගම් පිළිබඳ මූලික නිදහස, අනෙකුත් ආගම් ද සුරැකීම හා පරිරක්ෂණය සඳහා වූ රාජ්‍ය වගකීමක් බවට පත්වෙයි.

රාජ්‍ය ප්‍රතිපත්තිය වෙනස්කම්වලට හාජනය කිරීම් සිදු නොකරන්නා වූ එකක් විය යුතු නමුදු බුද්ධාගම් මතුකර දැක්වීම නිකාය වාදය පෙන්වන්නක් බව ප්‍රතික්ෂේප කළ නොහැක. කෙසේ වෙතත් බුද්ධාගම් මතුකර දැක්වීම වූ කලී

Human Rights Commission of Sri Lanka
No. 36, Kynsey Road,
Colombo 08.

යෙදූ ආගම් නොතකා එක් ආගමකට පමණක් ප්‍රමුඛත්වය ලබාදීමක් නොව අයම් යම් සංස්කෘතික උරුමයක් පරිරක්ෂණය සඳහා පැවරූ යුතුකමක් වශයෙන් ද පිළිගත යුතුය. ථේරවාදී බුද්ධාගම ශ්‍රී ලාංකික සංස්කෘතියේ වෙන්කළ නොහැකි අංශයකි. එය අභාවයට යාමේ තර්ජනයකට භාජනව ඇති අතර, එම ධර්මය එහි මුල් තත්ත්වයෙන් දැනට පවතින එකම රට ශ්‍රී ලංකාවයි. නිසැකවම සියලුම ආගම් සඳහා රජයේ සමාන අනුශාසකත්වය ලබාදිය යුතු අතර, "බුද්ධාගමට ප්‍රමුඛස්ථානය" දීමේ ව්‍යවස්ථාමය අවශ්‍යතාවය "බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම" සඳහා රජය වෙත පැවරී ඇති විශේෂ යුතුකම සමග සම්බන්ධ වෙයි. 10 වෙනි සහ 14 (1) (ඊ) වෙනි ව්‍යවස්ථා මගින් ලබා දී ඇති අයිතිවාසිකම් සියලූ ආගම්වලට සහතික කළයුතුය යන කොන්දේසියට 9 වැනි ව්‍යවස්ථාව යටත්වේ. එබැවින් රජය වෙත පැවරී ඇති යුතුකම, දැන් අන්තර්ජාතිකව ද ලෝක උරුම ඇති තැන් වශයෙන් පිළිගෙන තිබෙන පෞරාණික රාජධානි නටබුන් හෝ වැනි විහාරාන්තර පරිදි බෙහෙවින්ම පෞරාණික සංස්කෘතියට ආවේණික අංගයක් පරිරක්ෂණය කිරීම පිළිබඳ යුතුකමක් වන්නේය.

කෙසේ වෙතත් මෙම වගකීම ක්‍රියාත්මක කිරීම නිසා අනෙකුත් ආගම්වලට හෝ සුළුතර කොටස්වලට වෙනස්කමක් සිදුවන ආකාරයට විශේෂ සැලකීමක් සිදු නොකිරීම අනිවාර්ය වෙයි. විශේෂයෙන්ම සුළුතර (ආගමික) අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නෛතික පද්ධතිය සැදුම්ලත් නීති සංයුතිය තුළ ඊටම ඇතුළත් ඇතැම් පාලන හා තුලන විධි පවතී.

ශ්‍රී ලාංකික නීති පද්ධතිය නීති බොහෝ ගණනකින් සමන්විත වන අතර, ඊට රෝම/ලන්දේසි නීතිය සහ ඉංග්‍රීසි ව්‍යවහාර නීතියේ සම්ප්‍රදායන් මෙන්ම විවිධ සංස්කෘතික හා ආගමික සම්ප්‍රදායන් පදනම්කර ගත් පෞද්ගලික නීති තුනක් ද ඇතුළත් වෙයි. උඩරට නීතියට සහ තේසවලාමේ නීතියට පිළිවෙලින් ඇතැම් බෞද්ධ හා හින්දු චාරිත්‍ර ඇතුළත්ව තිබෙන අතර මුස්ලිම් නීතිය වූ කලී පූර්ණ වශයෙන් ඉස්ලාම් සම්ප්‍රදායන් සහ පුරාණය පදනම්කරගත් ශුද්ධ ධර්ම නීතියකි. රටේ පොදු නීතිය සහ විශේෂ (පෞද්ගලික) නීතියක් අතර ගැටුමක් තිබෙන විට පොදු නීතිය අභිබවා විශේෂ නීතියට මුල් තැන දෙනු ලබන බව දක්නට ලැබීම විශේෂයෙන් සිත් ගන්නා කාරණයකි[9].

තවද, ආගමික හා වෙනත් සුළුතර කොටස්වල අයිතිවාසිකම් වෙනත් නෛතික ප්‍රතිපාදන මගින් ද සහතික කර තිබේ. ආගම් 4 ම නියෝජනය කරන ආයතන ආරම්භ කරන ආගමික ක්‍රියාකාරකම් පහසු කිරීම සහ

ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තු පනත් පනවා තිබේ. බෞද්ධ විහාර ගම් ආඥාපනත, එංගලන්ත ක්‍රිස්තියානි සභා ආඥාපනත, බෞද්ධ හින්දු උපායාපන සභා පනත, මුස්ලිම් දේවස්ථාන සහ පින්ථාර්ථ භාරය හෙවත් වකුෆ් පනත යන මේවා නිදසුන්ය.

කෙසේ වෙතත්, තිබෙන්නා වූ විවිධ යන්ත්‍රණයන් කුමක් වූව ද, බහු ආගමික සමාජයක අසමානත්වය සහ විමතනය යන මේවා තවමත් සමාජ යථාර්ථයක්ව පවතී. ආගමික අයිතිවාසිකම් සඳහා ගැටුම් ඇතිවන්නේ ඒවා අහිමි කරන්නේය යන සිතුවිල්ල නිසාය. එබැවින් විවිධ කණ්ඩායම් අතර ආතති තත්ත්වයන් විද්‍යමානවීම් ආගමික සුළුතර කොටස් පිළිබඳ කරුණුවලට සම්බන්ධ භාවිතයන් හා යථාර්ථයන් පිළිබඳ දර්ශක බවට පත්වේ.

## 3. ආගමික නොඉවසීමට සම්බන්ධ ගැටුම් මෝස්තර

ශ්‍රී ලංකාව තුළ පවතින බුද්ධාගම, ක්‍රිස්තියානි ආගම, හින්දු ආගම, සහ ඉස්ලාම් ආගම යන ප්‍රධාන ආගමික පෙළගැසීම් මෙන්ම සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනවාර්ගික කණ්ඩායම් අතර "සිංහල-බෞද්ධ" අනන්‍යතාවය දිගින් දිගටම ඇදී යන කතාබහක පත්මාර වී තිබේ, විශේෂයෙන්ම සිංහල-දෙමළ ගැටුම් සංදර්භය තුළ එසේ වී තිබේ10.

බහු-ආගමික සමාජයක ගැටුම් පිළිබඳ සංකල්පය සලකා බලන විට කැපී පෙනෙන මෝස්තර දෙකක් දැකිය හැකිය. මිශ්‍ර සමාජවල නිතර දකින්ට ලැබෙන සමාජ සංසිද්ධියක් වන්නේ එක් පූජා කොට්ඨාසයක් විසින් අනෙකාට සිදුකරනු ලබන ප්‍රචණ්ඩ ක්‍රියා සහ හිංසා කිරීම් ය. විශේෂයෙන්ම සමාජ උපතනකාර් සහ ජනවාර්ගික/ආගමික ආතති තත්ත්වයන් පවතින කාලවලදී සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා සහ හිංසාවන්ය. මෙම සීමා කිරීම් එක්කෝ සංවිධානාත්මකව හෝ එසේ නැත්නම් ආවේගශීලීව හෝ මතුවන ප්‍රචණ්ඩ ක්‍රියා විය හැක.

ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි වඩාත් භයානක නැඹුරුවක් වන්නේ පෞද්ගලික ආරවුල් ඒවාට අදාළ පාර්ශ්වකරුවන්ගේ යම් නිශ්චිත ජනවාර්ගික/ආගමික අනන්‍යතා පදනම් කරගෙන උග්‍රවීමයි. මීට හොඳම නිදසුනක් වන්නේ 2001 මැයි මාසයේ දී මාවනැල්ලේ සිදු වූ මුස්ලිම්-සිංහල ගැටුම් වේ. පාර්ලිමේන්තු

මන්ත්‍රීවරයෙකු සහ පුරවැසියෙකු අතර වූ ආරවුලක්, අහම්බයක් ලෙස එම දෙදෙනා ජනවර්ග දෙකක අය වීම නිසා, අවසානයේ දී විශාල වශයෙන් පැතිර ගිය ජනවාර්ගික/ආගමික ගැටුමක් බවට පත්විය. මුස්ලිම් පල්ලියක් ඉදිකිරීම පිළිබඳ මෑතකදී මාලිගාවත්තේ දී ඇති වූ මාරාන්තික බවට ආසන්න වූ සිද්ධිය නිසා නැවතත් මුස්ලිම්වරුන් හා බෞද්ධයන් අතර ආතති තත්ත්වයන් ඇවිළී ගියේය.

තවද, සාමාන්‍ය වශයෙන් සලකන විට ආගමික සුළුතර කොටස්වල අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට භාජනය වී ඇති අතර, යම් සුළුතර කොටසක් බහුලව සිටින ප්‍රදේශයක ජීවත්වන බහුතර කොටසේ සාමාජික පිරිසකගේ අයිතිවාසිකම් ද එවැනි උල්ලංඝනය කිරීම්වලට භාජනය විය හැකි බව සත්‍යයකි. මෙය වූ කලී අත්දැකීමෙන් ලද සත්‍යයකි; විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශවල හා මායිම් ගම්මානවල එසේ සිදුවී ඇත. තවද ප්‍රධාන සුළුතර කොටස් දෙක අතර ද ගැටුම් රටා දැකිය හැක. 1990 දී සිදුකළ මුස්ලිම් දේවස්ථාන ඝාතන සිද්ධිය මීට නිදසුනකි. එහිදී මීරා ජුම්මා දේවස්ථානයේ බිම දිගාවී දේව මෙහෙයේ යෙදී සිටි පිරිමි සහ පිරිමි ළමයින්ගෙන් සමන්විත මුස්ලිම්වරුන් තුන්සියයකට වැඩි ගණනක් විශාල එල්.ටී.ටී.ඊ. භට පිරිසක් විසින් ඝාතනය කරනු ලැබුහ. මේ සිද්ධි වනාහි විවිධ කණ්ඩායම් අතර පවතින ආගමික නොඉවසීම පිළිබඳ සංඛ්‍යාණය දරගනවේ.

## 4. කල් පවත්නා විසඳුමක් ළඟාකරගැනීම පිණිස (මානව) අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර්-ආගමික අවබෝධයේ අවශ්‍යතාවය

සංස්කෘතික හා ආගමික වටිනාකම්වල ගැටුම් ලෙස සහ පිරිහී යෑම අනන්‍යතා ලෙස පෙනී යන්නා වූ තත්ත්වයට ගොදුරුව සිටින ජාතියකට ඉහත සඳහන් රෝග විනිශ්චය අනුව සුදුසු වන්නා වූ එකම ඖෂධ යෝගය වූ කලී නියත වශයෙන්ම විනිශ්චිත එකකි. එසේ නොමැතිව මේ තත්ත්වය වූ කලී ව්‍යවස්ථාමය සංශෝධනවල සිට නයවින අණපනත් දක්වා කොතරම් වුවත් එමගින් ශ්‍රී ලාංකික ජනතාවගේ ජීව ගුණය සාදුකර ගැනීමට නොහැකිය. පසු කාලයේ, ඉස්ලාමීය ශුද්ධ ධර්ම භාවිත අනුව ක්‍රිස්තියානි ආගම සහ කතෝලික ආගම් සමඟ එකට බද්ධ වූ පෞරාණික හින්දු-බෞද්ධ මූලාශ්‍ර විසින් අපේ උරුමයේ පරාමිති නියම

කරනු ලැබ තිබේ. මෙම අනේකවිධ වූ තත්ත්වයට නෛතිකව ඉඩ සැලසීම පිණිස උතුම් නෛතික සම්ප්‍රදායන් දෙකක් හා චාරිත්‍රානුකූල නෛතික පද්ධති තුනක් ද අවශෝෂවී තිබේ. ක්‍රියාත්මක වීමේදී නොවැලැක්විය හැකි තරම් ප්‍රමාණයක එක පිට එක පැටීමක් හා අර්ථාපත්තියක් පවතී11. එවැනි විවිධත්වයක් තුළ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව තේමාව දේශනා කළ හැක්කේ මානව හිතවාදී බවින් පොහොසත් ඒකාබද්ධ ජාතික සංස්කෘතියක් අගය කිරීමෙන් පමණි. මක් නිසාදයත් මිනිසාගේ අයිතිවාසිකම්, සමාජ සාධාරණය සහ සමානත්වය පිළිබඳ රක්ෂස්ථානය වශයෙන් සැලකෙන මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ ශතවර්ෂ ගණනාවකට පසු ගැබ්කොට ඇති සංකල්ප මෙම කවලම තුළ දක්නට ඇති නිසාය.

ඇතැම් බටහිර පොරොන සංස්කෘති "මෙම අයිතිවාසිකම් පරිනාමයේදී බටහිරට වඩා බෙහෙවින් පෙරදානම් වූ අතර, එම අයිතිවාසිකම්වල විපුල බව හා ව්‍යාපත්වය අභිත් බටහිර දුරස්ථ කළ" බව 12 ඉස්ලාම් ධර්මය නිදර්ශනයක් වශයෙන් දක්වමින් ආචාර්ය වීරමන්ත්‍රී සඳහන් කරයි. නූතන මානව අයිතිවාසිකම්වල නියම අරටුව යැදී ඇති මුල් බැසගත් සංකල්ප අනාදිමත් කාලයක සිට පෙරදිග දර්ශනවල සහ ආගම්වල මූලික පදනම වී තිබේ.

ශ්‍රී ලාංකික නීති පද්ධතිය ගලා එන්නේ මෙවැනි වූ අනේකවිධ වාර්ගික, සංස්කෘතික සහ ආගමික මූලාශ්‍රයන් ගෙනි. නූතන මානව අයිතිවාසිකම් තුළ "සමානත්වයට ඇති අයිතිවාසිකම" වශයෙන් වෙනස්වන, පීතෘ මූලික සමාජයක ස්ත්‍රී භාවයේ උතුම්කම වැනි සාමාන්‍ය සංස්කෘතික සංකල්ප ඇති වීමට හේතු වූයේ පැරණි ආගමික මතවාදයන් ය. ආගමික විශ්වාස තුළට මුල් ඇදී ගිය පොදු පූජා විධිවලට සංස්කෘතික භාවිත පැනනැගීම පිළිබඳ හොඳම නිදර්ශනයක් වශයෙන් සියලු ආගම්වල බැතිමතුන් විසින් සමනල කන්දට දක්වන භක්තිය පවතී.

ශ්‍රී ලංකාව සංස්කෘතික හා ආගමික වශයෙන් කොතරම් එකට බැඳී ඇද්ද යත් වෙනස්කම් තවදුරටත් එතරම් කැපී පෙනෙන්නේ නැත. "සිංහල දෙමළ අලුත් අවුරුද්ද" බෞද්ධයන් ක්‍රිස්තු භක්තිකයන් හා හින්දු භක්තිකයන් සහ සියලු දෙනාම එකසේ පවත්වති. තවද, සාමාන්‍ය ශ්‍රී ලාංකික බෞද්ධයෝ හින්දු දෙවිවරුන්, විශේෂයෙන් විෂ්ණු හා කතරගම

දෙවිවරුන්13 යැදීම සිර්තකි. එපරිදීම ශ්‍රී ලංකාවේ මුස්ලිම් විවාහ නිතිය ක්‍රිස්තියානි සහකරුවන් බැහැර කිරීම සම්පූර්ණ තහනමක් ලෙස නියම කර නැති නිසා ක්‍රිස්තියානි ආගම හා ඉස්ලාම් ආගම අතර සම්බන්ධතාවය තහවුරු කෙරේ14.

එසේ වුවද, අද දින ශ්‍රී ලංකාව බොහෝ සේ බෙදී පවතී; එසේ වී ඇත්තේ වැඩි වශයෙන් විවිධත්වය පිළිබඳ හැඟීමෙන් මිස විවිධ කොටස්වල පැවැත්ම නිසා නොවේ. වර්ගය, ආගම, සංස්කෘතිය පිළිබඳ වූ මෙම වෙනස්කම් ජයගත හැක්කේ, "ශ්‍රී ලාංකික සංස්කෘතියක්" තුළ පොදු මානුෂික භාවයක් පිළිබඳ හෝමාව අවබෝධ කර ගැනීමෙන් පමණි. ආගමික වෙනස්කම් අභිබවා මානව අයිතිවාසිකම් සහ අන්තර්-සංස්කෘතික අවබෝධය ප්‍රවර්ධනය කිරීමේ වෑයමේ දී එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනය ගැලපෙන අඩිතාලමක් ලබාදෙයි.

"විශ්ව ප්‍රකාශනය, එය විසින්ම අපගේ ලෝකය සඳහා ගිවිසගත් හරයන් නියම්කර ඇති අතර, එය මෙසේ කරන්නේ, කිසියම් නිශ්චිත දර්ශනයක, ආගමික හෝ සංස්කෘතියක පිහිට පැතීමකින් තොරවයි"15 කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ආගමික සම්ප්‍රදායන් එබඳු ප්‍රතිමාන සහ හරයන් කෙරෙහි කෙළින්ම අවධානය යොමුකර ඇති අතර, ඒවායේ විශේෂිත ආගමික පර්යාලෝකයන් පිළිබඳ වෙනස්කම් නොතකා ඒවායේ මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයන් විශ්ව ප්‍රකාශනය සමඟ එකඟවෙයි16. ශ්‍රී ලංකාවේ දක්නට ඇති පරිදි සංස්කෘතික හා ජනවාර්ගික බෙදීම්වලට මුල්වී ඇති ප්‍රධාන හේතු කාරකය වන්නේ ආගමයි. එමනිසා බුද්ධාගම, ක්‍රිස්තියානි ආගම, සහ ඉස්ලාම් ආගම සහ ඒවායේ සංස්කෘතික වැදගත්කම ගැන විශ්ව ප්‍රකාශනය අනුසාරයෙන් පරීක්ෂාකර බලන විට ඒවායේ අන්තර්ගතය තුළ ගැබ්කොට ඇති මානව අයිතිවාසිකම් පිළිබඳ පොදු භාෂිතය පෙන්නුම් කරයි.

මානව අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ සංකල්පය මූලික උපකල්පන දෙකක් තුළින් මතුවෙයි. එයින් එකක් දර්ශනවාදී වන අතර ආචාර ධර්මී එකකි. දර්ශනවාදී උපකල්පනය වන්නේ මනුෂ්‍යයන් පූර්ණ නිදහස හා වගකීම් සහිතව උත්පත්තිය ලබන බවයි17. මෙම මූලික නිදහස ගරුත්වය හා අයිතිවාසිකම්වල සමානත්වය පිළිබඳ සංකල්පය18 ද සමඟ බුද්ධාගම විසින් ආත්ම විශ්වාසය 19 කෙරෙහි දක්වා ඇති අවධාරණය මගින් පැහැදිලිව දක්වා තිබේ. තවද, ධම්ම පදය අනුව

කොතෙකුට තමාම පාලනය කළහැකිනම්, එවැන්නා නිදහස්ව උපත ලද්දාවෙයි. එබැවින් සියලු දෙනාටම බුද්ධත්වය ලැබීමට හැකිනම්, ගරුත්වය හා අයිතිවාසිකම් අතින් ඊට වැඩි සමානත්වයක් ඇතිවිය හැක්කේ කෙසේද?

බුද්ධාගමේ පළමු ශික්ෂා පදය 20 ජීවිතයට ඇති අයිතිය උතුම්කොට සුරකී. ශ්‍රීමත් එඩ්වින් ආනල්ඩ් මෙසේ කියන විට බුදුන් වහන්සේගේ ජීවන චර්යාව අරබයා ඔහු රචනා කළ මුනිවර ගීතිකා මෙම සත්‍යය දෝංකාර දෙයි. “kill not for pity's sake, lest ye slay, the meanest thing upon its upward sway”21 මේ අනුව මෙම කාරණය තුළ ජීවත්වීමේ අයිතිය පරිරක්ෂණය කර ඇති අතර, එය කෙළෙසිය නොහැක. බුද්ධාගමේ ඇති අංග තුනක් අනුසාරයෙන් මානව නිදහස තේරුම් ගත හැක.-එනම් හෘදය සාක්ෂිය, කථාව සහ ක්‍රියාවයි. කථාවට සහ ක්‍රියාවට මුල්වන්නේ හෘදය සාක්ෂිය වේ-එනම් බෞද්ධ ධර්මයේ දේශනාකොට ඇති පරිදි විශ්වීය හෝ ලෝකායත සත්‍යයයි22 එසේම වධහිංසාව සහ ශාරීරික උපද්‍රව පැමිණීම බෞද්ධ ධර්මයට පටහැනිවේ. මක්නිසාදයත් මනුෂ්‍යයා බුද්ධත්වය ලැබිය හැකි චිත්තකාය ඒකකයක් ලෙස සලකා ඇති හෙයිනි23. බෞද්ධ සංඝයා බුද්ධාගමේ පනවා ඇති චර්යා ධර්ම ආදර්ශයෙන් කියා දෙති. අර්ථය අනුව ඒවා මානව අයිතිවාසිකම් සුරැකීම සඳහා පනවා ඇති අතර, ගිහි සැදැහැවතුන් ඒවා අනුගමනය කරති.

බුද්ධාගමේ  මෙම මානව හිතවාදී මූලික ප්‍රවේශය වූ කලී එහි ජනප්‍රිය භාවයට, විශේෂයෙන්ම සමාජයීය වශයෙන් පීඩාවට පත්වී ඇති සමාජයේ පහළ තලයේ අය අතර ජනප්‍රිය භාවයට මූලික හේතුව වී තිබේ. “අයිතිවාසිකම් අහිමිවීම, දුප්පත්කම හා සාගින්න යන මේවායින් දුක්විඳින යටපත්වී සිටින බොහෝ මිනිසුන්ගේ සහයෝගය ලබාගැනීමට බුද්ධාගම සමත්විය...යහපත් ජීවිතයක් පිළිබඳව මිනිසුන්ගේ බලාපොරොත්තු නිශ්චිත ආකාරයට ප්‍රකාශ කිරීමට එය සමත්විය”24. ධර්ම මන්දිරය තුළ සාර්ව දයානුකම්පාව සහ මානව අයිතිවාසිකම් නැමැති කුළුණු චිරාත් කාලයක් නොසැලී පැවති ඇත; “සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා”25 ගෞතම බුදුන් වහන්සේගේ අනාවැකි සැබෑ කරමින් ධර්මයේ අතිශයින්ම පිරිසිදු තත්ත්වයට ලංකාද්වීපය පෝෂණ්‍යක් වූ අතර, එය අවුරුදු 2500 ක් තරම් ඈතට විහිදෙන සංස්කෘතික උරුමයක ආවේණික කොටසක් බවට පත්වී තිබේ.

Human Rights Commission of Sri Lanka
Library
No. 36, Kynsey Road,
Colombo - 08

ක්‍රිස්තියානි ආගම ගැන සලකන විට ද, පියාගේ වරස් සඳහන් කළ පරිදි "සදාචාරය වනාහි ක්‍රියාවේ මූලධර්මය වේ" දර්ශනය, විශ්වාසය හා ඇදහිල්ල යන මේවායේ පවතින වෙනස්කම් වූකලී මතුපිටින් පවතින ඒවාය. මන්තිසාදයන් ඒ සියල්ල පාලනය කරන මූලික සදාචාර ධර්මය වන්නේ මානව අගය පවත්වා ගැනීමයි. ආගම් මවනු ලැබුවේ දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපය මතය යනුවෙන් පැරණි තෙස්තමේන්තුවේ දැක්වෙන අදහස පිළිගන්නේ නම්, එයින් අදහස් කරන්නේ දේවමය මුද්‍රා ලකුණ මගින් මනුෂ්‍යයන්ට ඉතා උසස් ගණයේ අගයක් පිළිබඳ වටිනාකමක් ලබාදෙන බවකි26. මේ කාරණයෙන් දුවද ජීවිතයට ඇති අයිතිවාසිකම සහ මනුෂ්‍යයාගේ ගරුත්වය කැපීකොට දැක්වේ.

තවද දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපය මත මවනු ලැබූ මිනිසුන් සියලුදෙනාම සමානවන අතර, ඔවුනු දෙවියන් වහන්සේගේ පුතුන් (සහ දියණියන්) වෙති. එබැවින් දේවත්වය ඉදිරියේ සමානත්වය මිනිසාගේ ඇස් ඉදිරියේ සමානත්වයක් බවට පත් කිරීම හැර වෙන දෙයක් සිදුවිය නොහැක. මත් නියාදයන් මිනිසා මිනිසා විසින් පාලනය කරනු ලැබුවා වුව ද සියලු මිනිස් වර්ගයාට ඉහළින් දෙවියන් වහන්සේ රජ කරන හෙයින් දෙවියන් වහන්සේගේ රාජධානිය තුළ වෙනස්කම් නොමැති බව දුප්පතුන්, අවාසිදායක තත්ත්වයේ අය, සමාජයෙන් බැහැර කරනු ලැබුවන් යනාදී අයට උන්වහන්සේ දක්වන විශේෂ අවධානය මගින් හුවා දක්වනු ලැබේ27. බයිබලයේ ඇති උත්පත්ති කථාවේ සිට එළිදරව් කිරීම දක්වා දීවෙන "හොඳ" සහ "නරක" පිළිබඳ පේමාවන් වූ කළී වෙන කිසිවක් නොව "තර්කානුකූල බව" සහ "හෘදය සාක්ෂිය" පිළිබඳ නිදහස ක්‍රියාවට නැංවීම සඳහා වූ ආධාරකයන් ය. නරක පරාජය කොට සත්‍යය, සාධාරණය, සහ සාමය ජයගන්නා දු දෙවියන් වහන්සේගේ රාජධානිය තුළ "සහෝදරත්වයේ ආත්මය"හමුවිය හැක28.

ජීවිතය, ස්වාධීනත්වය හා ආරක්ෂාව පිළිබඳ අයිතිවාසිකම් යන මේ සියල්ල ක්‍රිස්තියානි ආගමේ ශුද්ධ ආම්ය ඇතුළත කැපකොට නියම්කොට ඇති සිද්ධාන්ත වේ. සටන්වන ලෙස යුදෙව්වන්ට ආරාධනා කරන ලැසිර්යා රජ ඔවුන් හැමෙනුටම "මහුගේම වයින්... මහුගේම ... පිග් වාක්ෂයෙන් අනුභවයට ද, තමන්ගේම කෙන්ඩියෙන් සෑම කෙනෙකුටම ජලය පානය කිරීමට ද" සහතික වෙයි29. "ඇසට ඇසක්" "දතට දතක්" යන භාවිතවල බැලූ බැල්මටම පෙනෙන දළ බව වුව ද, එවකට පැවති

වනචාර් අපරාධමය භාවිත පාලනය කිරීම සඳහා දැරූ උත්සාහයන් වේ. වධ හිංසාවෙන් සහ අවමානයෙන්30 බේරී සිටීමට මිනිසාට ඇති නිදහස මේ ක්‍රමවලින් සුරකින ලදී.

රජයේ නීතියට වඩා උසස් නීතියකින් පැනනැගින මානව අයිතිවාසිකම් න්‍යායක් සඳහා පදනමක් දේව වේදය විසින් ඉදිරිපත් කරනු ලබයි. එහි ප්‍රභවය උත්තරීතර තැනැත්තාය31. එබැවින් එය පූර්ණියවන අතර, කඩා කිරීමට ද නොහැක. මෙම අති පූර්ණීය ස්වභාවය හේතුවෙන් දය පසතින් ආරම්භවී මානව අයිතිවාසිකම් බරිබලයට සම්බන්ධ ලේඛනවල උපදේශගත කොට තිබේ. මානව අයිතිවාසිකම්වල පතුලටම කිදා බසින ධර්මයන් ශුද්ධවූ ග්‍රන්ථයේ පිටු අතර තිබේ. ඇදහීම තුළින් ඇතිවන විශ්වාසයන් නිසා එම ධර්මයන් මිනිසුන්ගේ සිත් තුළට කිදා බසී. එබැවින් කිමට ඇත්තේ, ''සොයාගන්න, එවිට ඔබට හමුවේ.'' යනුවෙන් පමණි.

මුස්ලිම් රචනාවගේ උරුමය වන පැරණි ඉස්ලාමීය ශිෂ්ටාචාරයේ බලපෑම් ගැන සලකා නොබලා ශ්‍රී ලංකාවේ බහුවිධ ජනවාර්ගිකත්වය සහ මානව අයිතිවාසිකම් යන තේමාව සලකා බැලීමට නොහැක. විශ්ව ප්‍රකාශනය අනුසාරයෙන් ඉස්ලාමීය සම්ප්‍රදායන් ගැන සලකා බලා ආචාර්යය ඒ.ආර්.පී. අමරසිංහ මහතා පළ කළ හැඟීම් ගරු කටයුතුය. ''ශුද්ධ වූ කුරාණය මත තම රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මග පෙන්වන මූලධර්ම පදනම්කරගත් සමාජ, දැන්න විශයෙන්ම එවැනි අයිතිවාසිකම් පවතින බව ඉතා පැහැදිලිව පිළිගත් අතර, ස්වභාවය අතින් මූලික හා විශ්වීය අතින් මානව වර්ගයා පොදුවේ පිළිගත්තාවූ එනි මූලික අයිතිවාසිකම් අනුගමනය කිරීම කෙරෙහි ඉතා උසස් වැදගත්කමක් ආරූඪ කළෝය''32.

ගරුත්වය වූ කලී මනුෂ්‍යයානු වශයෙන් ඉපදීමේදී අහිමිකළ නොහැකි තත්ත්වයකි. මන්නිසාදයන් ''මිනිසාගේ පුත්‍රයන්ට අප නියත ලෙසම ගරුත්වය ප්‍රදානය කර ඇත.'' යනුවෙන් කුරාණය සඳහන් කරන හෙයිනි. දෙවියන් වහන්සේගේ මැවීම පිළිබඳ කාර්යයේ දී මිනිසාට ඇති අති උතුම් තත්ත්වයක් මෙපරිද්දි උපාඛ්‍යාන පාඨ රාශියක දක්වා තිබේ. ''ආදම්ගේ පුත්‍රයන්ට අපි ගරු කරන්නෙමු... අප මැවූ විශාල ප්‍රමාණයකට වඩා ඉහළින් ඔවුන්ට විශේෂිත සැලකිලි දක්වා තිබේ''33.

ගරුත්වය හා අයිතිවාසිකම් අතින් මිනිසාගේ (සහ ගැහැණියගේ) සමානත්වය උල්ලංඝනය කළ නොහැකි බවට ශික්ෂාවක් පනවමින් කුරාණයේ ඇති ඉගැන්වීම් තුළ එම ගරුත්වය හා අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය ගැබ්කොට තිබේ. "මනුෂ්‍යයනි, තනි පුද්ගලයෙකුගෙන් ඔබලා මවා එයින්ම ඔබලාගේ සහකරු මැවූ දෙවියන් වහන්සේට ඇති ඔබලාගේ යුතුකම් ගැන සලකන්න... ඔබලා අන්‍යෝන්‍ය අයිතිවාසිකම් අයැද සිටින්නා වූ අල්ලාට ඇති ඔබලාගේ යුතුකම් ගැන සලකන්න, එසේම ඔබලාගේ ඥාති සම්බන්ධතා ගැන සිත් යොමුකරන්න" 34.

එපරිද්දෙන්ම "අල්ලා දෙවියන් විසින් පූජනීය බවට පත්කළ" ඇති 35 ජීවිතය උදුරා ගැනීම තහනම් කරන දේව කුරාණ නීතිය තුළ මිනිසාගේ ජීවිතය, ස්වාධීනත්වය සහ ආරක්ෂාව සුරැකීම පිළිබඳ වටිනාකම් ප්‍රතිග්‍රාහිත කර තිබේ. ඉස්ලාම් ආගමට අනුව සියලු ජීවය ගලා යන්නා වූ උල්පත සර්ව බලධාරීන් වන අතර එබඳු සියලු ජීවිතය පූජනීය වේ. එබැවින් ස්වාධීනත්වය සහ ආරක්ෂාව වැනි ජීවිතයක කොටසක් ද වේ. ඉස්ලාම් ධර්මය අනුව සදාචාරය, ආචාර ධර්ම සහ සත්‍යවේදී බව කෙරෙහි දක්වා ඇති අතිශය වැදගත් බව ගැන සලකා විනාචාර සහ අශීලාචාර වූ මිනිස් සමාජයේ වැරදි සඳහා කුරාණ ලේඛන මගින් පම් යම් දඬුවම් විධි පනවයි. කෙසේ වෙතත් ඉස්ලාමීය රාජ්‍ය පාලනයේ යුක්තිය සමග අනුකම්පාව මිශ්‍රවී තිබුණ අතර "සතුරා විසින් මුස්ලිම් රාජ්‍යයක් සමූලඝාතනය කර තිබුනා වුව ද මිනිසකුගේ අවයව කපා දැමීම තදින්ම තහනම් කෙරේ" 36. මෙම පුරාණ ශිෂ්ටාචාරය තුළ අපරාධ යුක්ති ක්‍රමයත් සමග වධ හිංසා පැමිණවීමෙන් නිදහස ද එකට පැවතුණි.

ශ්‍රී ලාංකික බහුවාර්ගික තත්ත්වයක් තුළ ඉස්ලාම් ආගමේ නොතිළිවී තත්ත්වයේ මෙම ප්‍රභාවිත්න ප්‍රවේශය අගය කිරීම වැදගත්වේ; මන්නිසාදයත් වෙනත් රාජ්‍යවල ජනප්‍රිය ලෙස අනුගමනය කරන්නාවූ මූලධර්මවාදී අර්ථකථන නිසා අගතිගාමී අදහස් දේශීය ජන කොට්ඨාස කෙරෙහි බලපෑම් කිරීමට ඉඩ ඇති හෙයිනි37. ලෝකය දැක තිබෙන ඉතා අධික අන්දමේ බුද්ධි උත්තේජනකාරී "පරිපූර්ණ සංස්කෘතික උරුමයන්ගෙන් එකක් ලෙස සැලකෙන්නක්"38 නූතන ලෝකය විසින් අගය කරනු ලැබීමෙන් ගිලිහීමත් එතුළ ගැබ්වී තිබෙන සත්‍යවාදී භාවය සහ යුක්තිය පිළිබඳ ලක්ෂණ එතුළ නැතැයි යනුවෙන් උපකල්පනය කොට විශේෂයෙන්ම බටහිර ලෝකය විසින් විවේචනය කරනු ලැබීමත් ඇත්ත වශයෙන්ම ඛේදජනක වෙයි.

අඩුකරමින් දේශීය තත්ත්වය තුළටත් ඉස්ලාම් ආගමේ මානව හිතවාදී ප්‍රවේශය පිළිබඳව මීට වඩා හොඳ අගය කිරීමක් තුළින් වර්තමාන ලෝක තත්ත්වය තුළ බටහිර ලෝකය විසින් දැඩි ලෙස කියාපාන එකී අයිතිවාසිකම් පිළිබඳ නියත ප්‍රකාශ කිරීම් හෙළිවනු ඇත. මක්නිසාදයත් "ලෝකයේ ජාතීන්ට එකිනෙකා අතර සමගිය ඇතිකර ගැනීම් සඳහා ඉස්ලාම් ආගම විසින් ඉතාමත් අගනා වැදගත්කමක් ඇති මූලධර්මයක් ස්ථාපිතකොට ලෝකයේ නියම ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවා, කොහෙන් සිට පැමිණියත් කිනම් ජාතියකට අයත් වුවත්, මිනිසා හා මිනිසා අතර ප්‍රභේද ඉවත් කරන ලද හෙයිනි"39.

ශ්‍රී ලාංකික හර පද්ධතිය සකස් කිරීමට හින්දු ආගම ද වැදගත් භූමිකාවක් ඉටු කරයි. මානව අයිතිවාසිකම් පිළිබඳ හින්දු දර්ශනය ද ක්‍රිස්තියානි ආගම හා ඉස්ලාම් ආගම පරිදිම දෙවියන් පිළිබඳ මූලයකින් ප්‍රකාශ වෙයි40. හින්දු ආගමේ උතුම් හරය වන්නේ අපරිමිත දෙවියන්ය; "එය එනම් පුද්ගල පැවැත්මක් නොවන හෝ පුද්ගල නොපැවැත්මක් හෝ නොවන බව කියන ආරම්භයක් රහිත උත්තරීතර පුද්ගල තත්ත්වයකි"41. මිනිසා එම පුද්ගල තත්ත්වයේ තාත්විකරණ විද්‍යමානවීමක් ලෙස සැලකෙන අතර, එක් ආකාරයකින් එහි කොටසකි. මේ අනුව මැවීමේ උසස්ම සව්පුත්‍ර මිනිසා සේ සැලකේ. මේ සංකල්පයෙහිම ගරුත්වය හා අයිතිවාසිකම් අතින් මිනිසාගේ සමානත්වය තහවුරුවෙයි.

කෙසේ වෙතත් හින්දු ආගම තුළ පවතින කුල ක්‍රමය නිසා එය අසමානත්වය ප්‍රවර්ධනය කරන බවට බැරෑරුම් ලෙස විවේචනය කරනු ලබයි. කෙසේ වෙතත් අද පවතින තත්ත්වය පරිදි වූ පිළිකාර කුලභේද ආත්මය හා බැඳී පවතින බවට හඳුනාගෙන තිබෙන සර්ව-ව්‍යාප්ත බ්‍රහ්ම පිළිබඳ හින්දු ධර්මයට බොහෝ සෙයින් ප්‍රතිවිරුද්ධ වෙයි42. ඇතැම් විද්වතුන් සලකන්නේ ඉන්දීය සමාජයේ බහුවාර්ගික ස්වභාවය නිසා එම සමාජය විසින් කුල ක්‍රමය ගොඩනැගුවක් බවයි43. බ්‍රහ්ම සූත්‍රයට අනුව "පුද්ගලයන්ගේ හොඳ සහ නරක ගැන දෙවියන් විතාන්‍යෙගේ සැලකීම් නිසා මැවීමේ දී අසමානතාවය ඇතිවී තිබේ." ඒ අනුව සමාජයේ විවිධ තරාතිරම් පැවැත්ම සනාථ කරයි. කෙසේ වෙතත් සියලුම තුළ

එකම පරම තොටින් දේව මූලයෙන් මතුවී ඇති වග උපකල්පනය කිරීම නිසා මිනිසාගේ මූලික සමානත්වය පැවැත්වෙයි44. තවද "සමාන තත්ත්වයේ අයට සමාන ලෙස සැලකීම" පිළිබඳ නීති විද්‍යාත්මක සංකල්පය හින්දු ආගම විසින් ආවරණය කරනු ලබයි45.

හින්දු ආගමේ හෘද සාක්ෂිය පිළිබඳ නිදසුන ක්‍රිෂ්ණාගේ වචනවලින් හෙළි වේ46. "මගේ සදාකාලික කොටසක් ලෝකයේ ජීවය බවට පත්වී භෞතික ශරීරයේ නැන්පත්ව සිට සවිඥාන වශයෙන් සිටින සිත ද සමගම ඉන්ද්‍රියයන් ආකර්ෂණය කරයි"47. පුරාණ හින්දු දර්ශනය තුළ පුද්ගලයකුගේ ජීවිතයට ස්වාධීනත්වයට හා ආරක්ෂාවට අයිතිවාසිකම ඇතිවන්නේ උන් අයගේ ඊට සම්බන්ධ බැඳීම් නිසාය. නිදසුනක් වශයෙන් නම් යටත් වැසියන් ආරක්ෂා කිරීම සඳහා වූ රජයේ යුතුකම් කෙරෙහි දැඩි අවධාරණයක් යොමුකරන ලදී. "සියලු ප්‍රාණීන්ට රැකුම ජීවය ලබාදෙන්නා යම් රජුගේ යුක්තිය ඔහුගේ වැසියන්ට ජීවය ලබාදෙයි" 48. තත් වැදගැම් මූලික නිදහස ආරක්ෂා කිරීම සඳහා තරමක් සංකීර්ණ හින්දු දර්ශනය තුළ පවතින මූලධර්ම ගැන අවබෝධයක් භගවත් ගීතාව කියවීමෙන් ලබාගත හැක.

හින්දුවරුන් ප්‍රධාන වශයෙන් වාසය කරන්නේ ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලය. මෑතක් වනතුරු මෙම ප්‍රදේශය ලේ ගැලීම් සහිත කෙළවරක් නැති ප්‍රශ්නයකින් විනාශයට පත්වූ අතර, දිවියිමේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ ගුහලමේ ප්‍රමාණය යටපත් විය. එසේ උල්ලංඝනය වූ (පුළුවන) අයිතිවාසිකම් දු කළි සාරධර්මයට මෙන් ආරක්ෂා කිරීමට එම යුද්ධය මගින් ඇම්නුමු කරගත් විධාමිය. ශ්‍රී ලංකාවේ බෙදුම්වාදය වශයෙන් බොහෝ කලක සිට විස්තර කරන්නාවූ තත්ත්වය අනුව බලන විට අන්තර්-සංස්කෘතික අවබෝධයේ පැදිසි අවශ්‍යතාවය ගැන පුනපුනා කීම අවශ්‍ය නැත. ඉහත සඳහන් විශ්ලේෂණය අනුව, ශ්‍රී ලංකාව සඳහාවන මුක්තිය වූ කළී ඒකාබද්ධ සංස්කෘතියක් තුළ පොදු අරමුණක් සඳහා නැවතළ අනන්තර හැකියාවන් නැවත සොයා ගැනීමේ ක්‍රියාවලියකි. මත නිසාදයන් බුදුන් වහන්සේ විසින් දේශනා කළ පරිදි "බම්යක් දිග මෙම ශරීරය තුළ සියල්ල සොයාගත හැකි" අතර එය ශ්‍රී ලාංකික සංස්කෘතිකාමය සම්ප්‍රදායන් පිළිබඳ ලේඛනාගාරයක් තුළ ගැඹුරින් වැළලී පවතී.

මේ අනුව පෙරදිග සංස්කෘතීන්ගේ සාරය වෙතින් විනිවිදින්නා වූ කේන්ද්‍රාපසාරී බලවේගයක් වශයෙන් මානව අයිතිවාසිකම් හඳුනාගැනීම වූ කලී රාජ්‍ය පාලනය පදනම් වශයෙන් පැවති ආධිපත්‍යමය ආගමික චින්තනයන් කෙරෙහි සම්බන්ධවී පවතී. එහෙත් අපරදිග අත්දැකීම වූයේ මානව අයිතිවාසිකම් යටපත් කරන චිරන්තන දෘෂ්ටි සහ භාවිත පැනවීමෙන් තම බලය ප්‍රවර්ධනය කිරීමට කැපවූ රෝමානු කතෝලික පල්ලිය වැනි බලවත් ආගමික ආයතන මගින් ගෙන ගිය රාජ්‍ය පාලනය සහ කාලයාගේ ඇවෑමෙන් රාජ්‍ය පාලනයෙන් ආගම වෙන්කළ ලෞකික රාජ්‍යයන් වර්ධනය වීමයි. මෙයින් ඇති වූ හිඩැස පිරවීම සඳහා ලෞකික රාජ්‍ය පාලනයට ආධාරක ක්‍රමයක් ලෙස ආගමික ඉගැන්වීම් වෙනුවට නිශ්චිත මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රමිති ඇති කිරීමේ අවශ්‍යතාවය මතුවිය. කෙසේ වෙතත් මානව හිතවාදී බවින් දැනටමත් පොහොසත් පෞරාණික සංස්කෘති මත මෙසේ එම ප්‍රමිතීම ස්ථාපනය කිරීම විහිළුවකි. මීට වඩා දැනටමත් තිබෙන්නාවූ ප්‍රතිමාන නවීකරණය කිරීම වඩාත් සාර්ථකවන බව ඔප්පු විය හැක. ශ්‍රී ලංකාව තුළ ද, වර්ගය, සංස්කෘතිය හා ආගම පිළිබඳ මතවාදී වෙනස්කම් තුළ සැඟවී ගත් මානව අයිතිවාසිකම් වූ කලී පොහොසත් හා පැරණි සංස්කෘතික උරුමයට ඒවා රැඳිරය වී තිබේ.

කරුණු මෙසේ හෙයින් ශ්‍රී ලංකාව සතු සම්ප්‍රදායික ආගමික හා සංස්කෘතික සම්මුතිවල අන්තර්ගත සිද්ධාන්ත පරීක්ෂාකර බැලීම වැදගත් වන්නේ, වඩාත් ගැඹුරු හරපද්ධති පදනම් වූ මූලාශ්‍රවලින් මතුවන සංක්ෂේප මානව අයිතිවාසිකම්වලට නූතන ව්‍යවස්ථාදායී ප්‍රමිති මත ස්ථාපනය කර තිබෙන කෘතිම තත්ත්වයට වඩා සම්ප්‍රදායික යටගියාවට බෙහෙවින් බැඳී ඇති ජාතියක ඇස් ඉදිරියේ තැනක් දීම පිණිසයි. මන්නිසාදයත් මානව අයිතිවාසිකම් පීඩාවන්ගෙන් හෙම්බත්වී සිටින ජාතියක් වශයෙන් ශ්‍රී ලංකාවේ ඛේදවාචකය පවතින්නේ එහි තුළ පවතින හර පද්ධතිය තුළ නොව පුද්ගලයා සම්බන්ධයෙන් පවතින වෙන්කොට තැබීමේ, අදූරදර්ශී හැසිරීම නිසාය.

"What though the spicy breezes
Blow soft o'er Ceylon's isle
Though every prospect pleases
And only man is vile..."

- Bishop Reginald Heber (1811)49

"පිය මනාප පුලං රැළි
හමා ගිය ද ලක් දිව මතින්
මනු දසුන් සින් බඳිනු වූව
කිම් උප්වින යහපත
දුප්ට වේ නම් මිනිසා පමණක් ...."

## සටහන්

1. පී.ඩී. ප්‍රේමසිරිගේ "Minorities in Buddhist doctrine" සමග කේ.එම්. ද සිල්වා සංස්කරණයකොට ඕමානතිත ප්‍රින්ටර් ප්‍රකාශකයන් 1998 ප්‍රකාශ කළ පෙන්ශ්‍රී විදුත්, වලන් එස්. ගෝල්ඩ් බර්ග් සහ නාදන් කාට්ස්ගේ Ethnic Conflict in Buddhist Societies-Sri Lanka, Thailand and Burma, නැමැති ග්‍රන්ථය (48 පිටුව) සසඳන්න.

2. ඉස්ලාමීය ඉරාන ජනරජයේ මානව අයිතිවාසිකම් තත්ත්වය පිළිබඳ වාර්තාව බලන්න. ඔක්ස්ෆර්ඩ් හි ක්ලැරෙන්ඩන් මුද්‍රණාලය මුද්‍රණය (1991) පළ කළ පෝන් බී, පැට්‍රික් යන අයගේ International Law and the Rights of Minorities, නැමති ග්‍රන්ථය හා සසඳන්න.

3. කෘෂ්ණ ස්වාමිගේ Study of Discrimination in the Matter of Religious Rights and Practices, එක්සත් ජාතීන්ගේ විකුණුම් අංක 60. XIV.2, 47-8, සමග ඔක්ස්ෆර්ඩ් හි ක්ලැරෙන්ඩන් මුද්‍රණය (1991) කළ පෝන් බී, පැට්‍රික් යන අයගේ International Law and the Rights of Minorities, නැමති ග්‍රන්ථය, පිටුව 191 හා සසඳන්න.

4. වෙබ් අඩවිය http://www.unesco.org/most/rr2int.htm

5. ස්ටීට් සහ මැක්ස්වෙල් (1997) ප්‍රසිද්ධ කළ වොලස්, රෙබේකා යන අයගේ International Human Rights නැමති ග්‍රන්ථයේ 144 පිටුව.

6. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වන ව්‍යවස්ථාව (1978 සැප්තැම්බර් 07-සංශෝධිත පරිදි)

7. සීමා නිර්ණායන කොමිසමේ වාර්තාව, 1959 XV සැසි වාර්තාවේ 13 පිටුව සමග සීමාසහිත සෙඩ් බුක්ස් (1983) ප්‍රසිද්ධ කළ සචී පොන්නම්බලම්ගේ Sri Lanka-The National Question and the Tamil Liberation Struggle නැමැති ග්‍රන්ථයේ 72 පිටුව සසඳන්න.

8. "එකලාව හෝ අන් අය හා සමග, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම හෝ ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිගැනීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමට නිදහස"[ව්‍යවස්ථාව 14 (1)(ඉ)]

9. මීට හේතුව රෝම-ලන්දේසි නීතියේ "Generalia specialibus non derogata" යන මූලධර්මය වේ.

10. කේ.එම්. ද සිල්වා සංස්කරණය කළ පද්මසිරි ද සිල්වාගේ "The logic of identity profiles and the ethic of communal violaence: A Buddhist perspective" ග්‍රන්ථය සමග (1988) සීමා සහිත පින්ටර් ප්‍රකාශකයන් ප්‍රකාශිත පෙන්ශ්‍රී ඩියුක්, එස්. එලන්, ගෝල්ඩ් බර්ග් සහ නාදන් කාට්ස් රචිත Ethnic Conflict in Buddhist Societies Sri Lanka. Thailand and Burma,- පිටුව සසඳන්න.

11. මේ නිසා "Generalia specialibus non derogata" යන මූලධර්මය කෙරෙහි නිතර විශ්වාසය තැබීමට සිදුවී තිබේ.

12. සී.ජී. වීරමන්ත්‍රීගේ "Justice without Frontiers: Furthering Human Rights (1වන වෙළුම), Kluwer Law International (1997) පිටුව 7 (මින් පසු Justice without Frontiers යනුවෙන් සඳහන් වෙයි.)

13. මේ දෙවිවරුන් දෙදෙනාම අනාගත භවයක දී බුද්ධත්වය ලබාගැනීමට පෙරුම් පුරන්නේය යන්න පොදුවේ පවතින විශ්වාසයකි.

14. එවැනි විවාහ "භාසිඩ්"(ඉඩ දිය හැකි තරමේ විවාහ) මිස "බතිල්" (සම්පූර්ණයෙන්ම තහනම් කළ විවාහ) නොවේ.

15. හොරේෂ් පෙරේරා සංස්කරණයකොට 1988 දී ශ්‍රී ලංකා පදනම් ආයතනය ප්‍රසිද්ධ කළ Human Rights and Religions in Sri Lanka, යන ග්‍රන්ථය (මින් පසු Human Rights and Religions ) පිටුව X

16. ඉහත 15 සටහනේ සඳහන් නාහිය

17. Human Rights and Religions ග්‍රන්ථයේ 3 වන පිටුවේ අංක 14 සටහන

18. විශ්ව ප්‍රකාශනයේ 1 වන ව්‍යවස්ථාව

19. පුද්ගලික උත්සාහය (අත්තකාර) මිනිස් උත්සාහය (පුරිසකාර) මිනිස් ශක්තිය (පුරිසාත්ම) මිනිස් බලය (පුරිසවිරිය) මිනිස් ධෛර්‍යය (පුරිසපරාක්‍රම) සහ මිනිස් වගකීම් (පුරිසධෝරය)

20. පංචසීල

21. ශ්‍රීමත් එඩ්වින් ආර්නල්ඩ්ගේ Light of Asia ග්‍රන්ථය.

22. Human Rights and Religions - 23 වන පිටුව 14 සටහන

23. නාම සහ රූප

24. තලින් සුවාරිස්ගේ Buddhism, Human Rights and Social Renewal, Asian Human Rights Commission (2000 දෙසැම්බර්)-14 වන පිටුව.

25. May all beings be well and happy සියලු සත්වයෝ නිදුක් වෙත්වා සුවපත් වෙත්වා.

26. ජේ.සර්ස්වැක් රේරෝම්ගේ Philosophic Foundations of Human Rights නැමති ග්‍රන්ථයේ 205 වන පිටුව (1998) ජෝන් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ The Human Rights Quarterly සඟරාවේ 20 වන වෙළුමේ 2 වන කලාපයේ-1998 මැයි-සමග සසඳන්න.

27. Human Rights and Religions ග්‍රන්ථයේ 8 වන පිටුව. 14 වන සටහන

28. මෙම සියලු ලක්ෂණ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 1වන ව්‍යවස්ථාවේ ඇඟවී තිබේ.

29. Human Rights and Religions ග්‍රන්ථයේ 25 වන පිටුව, 14 වන සටහන

30. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 5 වන වගන්තිය.

31. Philosophic Foundations of Human Rights - සටහන 25

32. ඒ.ආර්.බී. අමරසිංහගේ Human Rights and the Islamic Tradition නැමැති ග්‍රන්ථය, සර්වෝදය පොත් ප්‍රකාශන සේවාව විසින් (1994) ප්‍රකාශිත එස්.ජේ. සුමනසේකර බණ්ඩා විසින් සංස්කරණය කළ Life is simply a duty-some speeches by A.R.B. Amerasinghe නැමැති ග්‍රන්ථය සමග සසඳන්න.-116 පිටුව

33. සී.ජී. වීරමන්ත්‍රීගේ Islamic Jurisprudence-An international Perspective - සර්වෝදය විශ්ව ලේඛා ප්‍රකාශය (1999)

34. කුරානය 4:1

35. ඉහත 14 වන සටහනේ සඳහන් Human Rights and Religions ග්‍රන්ථයේ 27 පිටුව.

36. ඉහත සටහනේ Human Rights and Religions ග්‍රන්ථයේ 47 පිටුව.

37. නිදසුනක් වශයෙන් ඉස්ලාම් ධර්මයේ නාමයෙන් ඇෆ්ගනිස්ථානයේ සිදුවූ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ලෝක ප්‍රජාව බියට පත්කර ඇත.

38. ඉහත සඳහන් Islamic Jurisprudence ග්‍රන්ථයේ 112 පිටුව.

39. ඒ. දෝයි සහ එරි. රහමාන්ගේ Non Muslims under Shari'ah (Islamic Law), Ta Ha Publishers Ltd. (1979- 76 පිටුව)

40. මහා බ්‍රහ්ම වශයෙන් හඳුන්වනු ලැබේ.

41. ඔස්බෝර්න් ආතර්-Buddhism and Christianity in the light of Hinduism-රයිඩර් සහ සමාගම ලංඩන්-පිටුව 40. භගවත් ගීත xiii, 12

42. කේ.එම්.සෙන් - Hinduism-The world's oldest faith, පෙලිකන් පොත් (1963) 27 පිටුව.

43. කේ.එම්.සෙන් - Hinduism-The world's oldest faith, පෙලිකන් පොත් (1963) 27 පිටුව.

44. ඉහත 14 වන සටහනේ සඳහන් Human Rights and Religions නැමැති ග්‍රන්ථයේ 6 පිටුව.

45. අමූර්ත හා ක්‍රියාත්මක කළ නොහැකි සම්මුතියකට වඩා ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව පිළිබඳ මෙම අර්ථකථනය අධිකරණය මගින් පිළිගනු ලබයි.

46. ක්‍රිෂ්ණා වනාහි මිනිසුන්ගේ ජීවිත කාලයන් තුළ ඔවුන්ගේ ජීවිත නිගමනය කරන්නාවූ ද ක්‍රියාකාරකම් පාලනය කරන්නා වූ ද දෙවියා වේ. (උත්පත්තිය බ්‍රහ්ම විසින් ද මරණය ශිව විසින් ද නිගමනය කරන්නා සේය)

47. භගවත් ගීතා 15:7

48. ඉහත 14 වන සටහනේ සඳහන් Human Rights and Religions ග්‍රන්ථයේ 24 පිටුව. තිරුක්කුරාල් 452 පිටුව සමග සසඳන්න.

49. In Greenland's Icy Mountains නැමැති පොතේ සඳහන් මෙම කොටස විලියම් මැක් ගොවන්ගේ Only Man is Vile-The tragedy of Sri Lanka සමග සසඳන්න.

ISBN 955 - 582 - 103 - 8

Printed By. Unie Arts (Pvt) Ltd